ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
**General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024**

| 13 ශ්‍රේණිය | 25 S I | ශ්‍රී ලංකා ඉතිහාසය - I | කාලය : පැය එකයි. Time : One hour |
|---|---|---|---|

ශ්‍රී ලංකා ඉතිහාසය : ඈත අතීතයේ සිට ක්‍රි.ව.1978 දක්වා.

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- I කොටස **01 – 40** දක්වා ප්‍රශ්න **සියල්ලටම** මෙම පත්‍රයේම ලබා දී ඇති උපදෙස් පරිදි පිළිතුරු සපයන්න.
- I කොටසෙහි නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- කොටස් දෙකටම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනා ගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. 1. සමන්තපාසාදිකාව 2. සහස්සවත්ථුප්පකරණය 3. සාරාර්ථදීපනී
4. දිව්‍යාවදානය 5. රාජරත්නාකරය (........)

02. 1. දීපවංශය 2. මහා වංශය 3. රසුවංශය
4. බෝධිවංශය 5. ථූපවංශය (........)

03. 1. පාහියංගල 2. බෙලිලෙන 3. බටදොඹලෙන
4. දොරවක 5. බූන්දල (........)

04. 1. හුරුළු වැව 2. මින්නේරිය වැව 3. මහකනදරා වැව
4. කන්තලේ වැව 5. මාමිනියා වැව (........)

05. 1. ලඤ්ජතිස්ස 2. සිරිනාග 3. ථුල්ලත්ථන
4. වල්ලාටනාග 5. වට්ටගාමිණී (........)

06. 1. උඩුනුවර 2. යටිනුවර 3. මතුරට
4. දුම්බර 5. හේවාහැට (........)

07. 1. දන්තුරේ සටන 2. බලන සටන 3. ගන්නෝරුව සටන
4. රන්දෙනිවල සටන 5. වෙල්ලස්ස සටන (........)

08. 1. එච්.එස්.ඔල්කට්තුමා 2. එම්.සී.සිද්දි ලෙබ්බෙ 3. ආරුමුග නාවලර්
4. සී.එච්.කැමරන් 5. අනගාරික ධර්මපාල (........)

09. 1. එඩ්වඩ් බන්ස් 2. හෙන්රි වෝඩ් 3. ෆ්‍රෙඩ්රික් නෝර්ත්
4. ජේම්ස් කෝඩිනර් 5. විල්මට් හෝර්ටන් (........)

10. 1. පුවිරාජ පණ්ඩාරම් 2. සෙම්බග පෙරුමාල් 3. වරෝදය
4. කුලශේකර 5. මාර්තන්ඩ (........)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැළපෙන පද යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. 1. දැදුරු ඔය - මාගල්ල වැව
    2. මල්වතු ඔය - නාච්චදූව වැව
    3. මහවැලි ගඟ - මින්නේරිය වැව
    4. යාන් ඔය - හුරුළු වැව
    5. කලා ඔය - කලා වැව (........)

12. 1. වංසත්ථප්පකාසිනි - මහා වංශයට ලියූ අටුවාවකි.
    2. සඳ ලකුණ - පොළොන්නරු යුගයට අයත් ව්‍යාකරණ ග්‍රන්ථයකි.
    3. පූජාවලිය - අරහං යන බුදුගුණය විස්තර කර ඇත.
    4. කව්සිළුමිණ - මඛාදේව ජාතකය ඇසුරින් ලියා ඇත.
    5. සරජෝති මාලෙයි - ද්‍රවිඩ බසින් ලියා ඇති ජ්‍යොතිෂ්‍ය ග්‍රන්ථයකි. (........)

13. 1. සූරතිස්ස - එළාර
    2. පළමුවන සේන - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
    3. හතරවන උදය - පළමුවන පරන්තක
    4. පස්වන මිහිඳු - පළමුවන රාජ රාජ
    5. පරාක්‍රම පණ්ඩු - කාලිංග මාඝ (........)

14. 1. පොන්නම්බලම් අරුණාචලම් - ලංකා ජාතික සංගමය
    2. එන්.එම්.පෙරේරා - ලංකා සම සමාජ පක්ෂය
    3. ඩී.ඒ.සේනානායක - එක්සත් ජාතික පක්ෂය
    4. ජී.ජී.පොන්නම්බලම් - ෆෙඩරල් පක්ෂය
    5. එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (........)

15. 1. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය - ව්‍යවස්ථාදායක විධායක සභා පිහිටුවීම.
    2. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
    3. මැනිං ප්‍රතිසංස්කරණය - පළාත්බද නියෝජනය හඳුන්වා දීම.
    4. සෝල්බරි ප්‍රතිසංස්කරණය - විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම.
    5. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - නාමික විධායකයක් හඳුන්වා දීම. (........)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු X සහ Y තීරුවල දී ඇත. Y තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළකට නොවේ. Y තීරය X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.

16.

| X | Y |
|---|---|
| 1. වල්ලිපුරම් | A. කතිකාවත |
| 2. ගල්පොත | B. පර්වත ලිපි |
| 3. ගල් විහාරය | C. රන් පත |
| 4. තෝනිගල | D. තඹ සන්නස |
| 5. පනාකඩුව | E. පුවරු ලිපිය |

1. C E B D A    2. A C D B E    3. C E A D B
4. C E A B D    5. B A C E D (........)

17. X Y

| X | Y |
|---|---|
| 1. කොටවෙහෙර | A. දේවානම්පියතිස්ස රජතුමා |
| 2. ථූපාරාමය | B. මහා පරාක්‍රමබාහු රජතුමා |
| 3. අභයගිරිය | C. මහසෙන් රජතුමා |
| 4. ජේතවනාරාමය | D. දුටුගැමුණු රජතුමා |
| 5. රුවන්වැලි මහසෑය | E. වලගම්බා රජතුමා |

1. B A E C D 2. B E C D A 3. B A E D C
4. B C D E A 5. B D A E C (........)

18.

| X | Y |
|---|---|
| 1. කුරුවේ බද්ද | A. ප්‍රවාහන කාර්යාංශය |
| 2. මඩිගේ බද්ද | B. අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| 3. මහ බද්ද | C. වියන්නන් පිළිබඳ කාර්යාංශය |
| 4. කොට්ටල් බද්ද | D. කුරුඳු දෙපාර්තමේන්තුව |
| 5. කින්නර බද්ද | E. ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |

1. B A D E C 2. B E D C A 3. B D E C A
4. B D C E A 5. B A E D C (........)

19.

| X | Y |
|---|---|
| 1. 1017 ක්‍රි.ව. | A. ප්‍රථම නිදහස් අරගලය |
| 2. 1215 ක්‍රි.ව. | B. විජයබා කොල්ලය |
| 3. 1521 ක්‍රි.ව. | C. චෝල ආක්‍රමණය |
| 4. 1796 ක්‍රි.ව. | D. කාලිංග මාඝ ආක්‍රමණය |
| 5. 1818 ක්‍රි.ව. | E. ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම. |

1. C B E D A 2. A B C D E 3. C D B E A
4. C A B E D 5. C B A E D (........)

20.

| X | Y |
|---|---|
| 1. පද්මාවතී පිරිවෙන | A. කෑරගල |
| 2. විජයබා පිරිවෙන | B. රයිගම |
| 3. ශ්‍රී ගනානන්ද පිරිවෙන | C. පැපිලියාන |
| 4. සුනේත්‍රා දේවි පිරිවෙන | D. තොටගමුව |
| 5. ඉරුගල්කුලතිලක පිරිවෙන | E. දෙවිනුවර |

1. A B C D E 2. A D B C E 3. B A E D C
4. B A D E C 5. B D C E A (........)

- අංක 21 සිට 25 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. පොළොන්නරුවේ චෝළ පාලනය
    1. පොළොන්නරුවේ ජනනාථපුරම් ලෙස නම් කරන ලදි.
    2. ශ්‍රී ලංකාවේ උතුරු කොටස මුම්මුඩිචෝල මණ්ඩලම් ලෙස හැඳින්විණි.
    3. චෝළයන් විසින් පොළොන්නරුවේ අංක 02 ශිව දේවාලය ඉදිකරන ලදි.
    4. වෙල්ගම් වෙහෙර රාජරාජපෙරුම්පල්ලි යනුවෙන් නම් කරන ලදි.
    5. I රාජරාජ සහ රාජේන්ද්‍ර පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේය. (........)

22. යාපනය රාජධානිය
   1. යාල්පානම් වෛපවමාලෛ යාපන රාජධානිය පිළිබඳව අධ්‍යනය කිරීමට තිබෙන ප්‍රධාන මූලාශ්‍රයයි.
   2. විජය කුලංගෙයි චක්‍රවර්ති යාපන රාජධානියේ ප්‍රථම පාලකයා විය.
   3. නල්ලූර් යාපන රාජධානියේ අගනුවර විය.
   4. ක්‍රි.ව.1619 දී පෘතුගීසීන් විසින් යාපන රාජධානිය යටත් කරගන්නා ලදි.
   5. මැදවල සෙල්ලිපියට අනුව ගම්පල රජවරු යාපන රාජධානියෙන් කප්පම් ගන්නා ලදි. (........)

23. ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය
   1. ලන්දේසි පූජකවරයෙක් වූ ගොන්සාල්වේස් උඩරට ජනතාව රෙපරමාදු ආගමට හැරවීම.
   2. පාසල් හා පල්ලි මඟින් ආගම ප්‍රචාරය කිරීම.
   3. කතෝලික ආගම මර්ධනය කිරීම.
   4. සියලු ම ලන්දේසි පූජකවරුන්ට වැටුප් ගෙවන ලද්දේ වෙළඳ සමාගම් මඟිනි.
   5. සිවිල් පරිපාලනයේ ඉහළ තනතුරු දෙන ලද්දේ ඔවුන්ගේ ආගම් ඇදහුවන්ට ය. (........)

24. කෝපි වගාවේ ව්‍යාප්තිය
   1. ලන්දේසීන් කෝපි වගාව ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත්හ.
   2. ජෝර්ජ් බර්ඩ් මහා පරිමාණයේ පළමුවන කෝපි වත්ත ගම්පොළ ආරම්භ කළේ ය.
   3. බ්‍රිතාන්‍ය ආණ්ඩුව කෝපි වගාවන්ට අනුග්‍රහය ලබා දුන්නේ ය.
   4. කෝපි වතුවල වැඩ කිරීම සඳහා දකුණු ඉන්දියානු කම්කරුවන් ගෙන එන ලදි.
   5. විසිවන සියවස ආරම්භයේ දී යුරෝපීය වෙළඳපළේ ලංකාවේ තේ සඳහා ඉහළ ඉල්ලුමක් තිබීම.
   (........)

25. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ
   1. පූර්ණ විධායක බලය සහිත ජනාධිපති පදවිය ඇති කිරීම.
   2. සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම.
   3. මේ දක්වා ලංකාව ලෙස හැඳින් වූ අපේ රට ශ්‍රී ලංකා ලෙස හැඳින්වීම.
   4. දෝෂාභියෝගය, ඔම්බුඩ්ස්මන් තනතුර හඳුන්වා දීම.
   5. මූලික අයිතිවාසිකම් සඳහා නව වගන්ති කිහිපයක් හඳුන්වා දීම. (........)

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරන්න.

  (A) සහ (B) පමණක් නිවැරදි නම් ................................................................ 1 ද
  (B) සහ (C) පමණක් නිවැරදි නම් ..................... ........................................ 2 ද
  (C) සහ (D) පමණක් නිවැරදි නම් ............................................................... 3 ද
  (A) සහ (C) පමණක් නිවැරදි නම් ............................................................... 4 ද
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හේ නිවැරදි නම් ........................ 5 ද වරහන් තුළ යොදන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම සම්බන්ධව පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   A. ආර්යයන් ඉන්දියාවේ සිට පැමිණි පිරිසකි.
   B. ඔවුන්ගේ ප්‍රධාන ආර්ථික කටයුත්ත වූයේ කෘෂිකර්මාන්තයයි.
   C. මුල්ම ආර්ය ජනාවාස පිහිට වූයේ තෙත් කලාපයේ ය.
   D. ආර්යයන් කිසිවෙක් වෙළඳාමට සම්බන්ධ වූයේ නැත. (........)

27. පණ්ඩුකාභය රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A. අනුරාධපුර නගරය ගොඩනංවා එය තම අගනුවර කර ගත්තේ ය.
B. දකුණු ඉන්දීය ආක්‍රමණයක් සාර්ථකව මැඩපැවැත්වී ය.
C. මදුරාපුර කුමරියක් ආවාහ කර ගත්තේ ය.
D. දිවයින පුරා ග්‍රාමසීමා නියම කළේ ය. (........)

28. නිශ්ශංකමල්ල රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A. බුරුම දේශය ආක්‍රමණය කළේ ය.
B. චන්ද්‍රභානු පරාජයට පත් කළේ ය.
C. තමා කාලිංග කුමාරයෙක් ලෙස හඳුන්වා ගත්තේ ය.
D. හැටදාගෙය නැමැති දළඳා මැදුර ඉදි කළේ ය. (........)

29. II පරාක්‍රමබාහු රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A. දන්ත ධාතුව කොත්මලේ සිට දඹදෙණියට වැඩම කරවීය.
B. කාලිංග මාඝ පරාජයට පත් කළේ ය.
C. කව්සිළුමිණ නැමැති මහාකාව්‍ය ග්‍රන්ථය රචනා කළේය.
D. ලංකාවේ අගනගරය යාපහුවට ගෙන ගියේ ය. (........)

30. 1943 ප්‍රසිද්ධ කල අධ්‍යාපන විශේෂ කාරක සභා වාර්තාවෙන් සී.ඩබ්ලිව්.කන්නන්ගර මහතා ඉදිරිපත් කළ අධ්‍යාපන යෝජනා සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
A. සෑම ඡන්ද කොට්ඨාසයකම මධ්‍ය මහා විද්‍යාලයක් බැගින් පිහිට විය යුතුය.
B. බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නිදහස් අධ්‍යාපනයක් ලබා දිය යුතුය.
C. අවුරුදු පහේ දී අනිවාර්යෙන්ම ළමුන් පාසල් යැවිය යුතුය.
D. රජයේ සහ පෞද්ගලික පාසල් වල එක සමාන අධ්‍යාපනයක් ලබා දිය යුතුය. (........)

- අංක **31** සිට **35** දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

31. කුරුණෑගල යුගයේ රචිත කෘති පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
1. සිංහල ජාතක පොත, උම්මග්ග ජාතකය, නිකාය සංග්‍රහය
2. දඹදෙණි අස්න, සිංහල ජාතක පොත, උම්මග්ග ජාතකය
3. ථූප වංශය, මයුර සංදේශය, නිකාය සංග්‍රහය
4. පංචිකා ප්‍රදීපය, කුවේණි අස්න, එළු සිලෝ ශතකය
5. පූජාවලිය, සිදත් සඟරාව, පත්තිනි හෑල්ල (........)

32. "චෙංහෝ" නැමති චීන සෙන්පතියා විසින් චීනයට අල්ලාගෙන යන ලද රයිගම පාලකයා කවුද?
1. සකල කලා වල්ලභ 2. සේනාධිලංකාර 3. දේවමන්ත්‍රී
4. වීර අලකේශ්වර 5. අම්බුළුගල කුමාරයා (........)

33. මුහුදුබඩ පළාත්වල රාජකාරි ක්‍රමය ප්‍රථම වතාවට අවලංගු කළේ කවුද?
1. පෙඩ්‍රික් නෝර්ත් 2. තෝමස් මෙට්ලන්ඩ් 3. ද මියුරන්
4. රොබට් බ්‍රවුන්රිග් 5. විලියම් කෝල්බෲක් (........)

34. හෙන්රි ස්ටීල් ඕල්කට් අනගාරික ධර්මපාල සහ ඩී.බී.ජයතිලක යන තිදෙනා විසින් බෞද්ධ පුනරුදය සඳහා පිහිට වූ ආයතන අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
1. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම, කොළඹ තරුණ බෞද්ධ සංගමය, මහබෝධි සමාගම
2. මහා බෝධි සමාගම, පරම විඥානාර්ථ බෞද්ධ සමාගම, කොළඹ තරුණ බෞද්ධ සංගමය
3. කොළඹ තරුණ බෞද්ධ සංගමය, මහා බෝධි සමාගම, වාමාංශික ව්‍යාපාරය
4. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම, මහා බෝධි සමාගම, අමද්‍යප ව්‍යාපාරය
5. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම, මහා බෝධි සමාගම, , කොළඹ තරුණ බෞද්ධ සංගමය

(........)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

35. ලන්දේසීන් යටතේ පැවති බලකොටුව පාලනය භාරව සිටි නිලධාරියා හැඳින්වූයේ කවර නමින් ද?
   1. සුපිරින්ටෙන්ඩඩ්   2. ඕපර් හුප්ට්   3. කොමාන්ඩර්
   4. විසුරේ   5. ඌවිදෝර්   (........)

❖ අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | පිළිතුර |
|---|---|---|---|
| 36. | දීප වංශය ශ්‍රී ලංකාවේ ඉතිහාස පරම්පරාවෙන් දැනට ඉතිරි වී ඇති පැරණිම ග්‍රන්ථයයි. | දීප වංශයේ දෙවන කොටස ඇතැම් ඉතිහාසඥයින් විසින් චූල වංශය ලෙස හඳුන්වනු ලැබේ. | (........) |
| 37. | පැරණි ලක්දිව අලුත් රජෙකු පත් කිරීමේ දී අභිෂේක උත්සවයක් පවත්වන ලදි. | රජකම නීත්‍යානුකූල වීම සඳහා අභිෂේකය අත්‍යවශ්‍ය කාරණයක් විය. | (........) |
| 38. | I පරාක්‍රමබාහු රජු II ගජබාහු රජු සමග ගිවිසුමකට එළඹුන බවට සංගමව විහාර ලිපිය සාක්ෂි දරයි. | I පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය රජුට උපකාර කිරීම සඳහා 1169 දී ආධාර හමුදාවක් එහි යැවීය. | (........) |
| 39. | ක්‍රි.ව.1506 දී පෘතුගීසීන් විසින් යාපනය රාජ්‍යය යටත් කර ගන්නා ලදි. | ක්‍රි.ව. 1630 දී දියෝගුද මෙලෝ කැස්ත්‍රෝ විසින් දියත් කළ උඩරට ආක්‍රමණය රන්දෙණිවල සටනින් මුළු මනින්ම පරාජයට පත් විය. | (........) |
| 40. | ක්‍රි.ව. 1521 දී කෝට්ටේ රාජ්‍යයේ ඇති වූ දේශපාලන අරගලය “සිංහල සංගය” යනුවෙන් හැඳින්වේ. | 1931 සිට ක්‍රියාත්මක වූ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මුළු සාමාජික සංඛ්‍යාව 61 විය. | (........) |

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!